# මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභා රැස්වීම් වාර්තාව

2025.07.03 වන දින පෙ.ව.9.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රධාන කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී පැවති මුදල් හා ප්‍රතිපත්තිමය කාරකසභා රැස්වීමේදී ගරු සභාපතිතුමා විසින් මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාවේ සාමාජිකයන් පිළිගැනීමෙන් අනතුරුව අනුමැතිය ලබාගැනීම සඳහා විෂයභාර නිලධාරීන්, බාහිර ආයතන හා පුද්ගලයන් විසින් ඉදිරිපත් කල ලිපිලේඛන පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව එම ලිපි සම්බන්ධයෙන් මුදල් හා ප්‍රතිපත්තිමය කාරකසභාව විසින් ලබාගත් තීරණ පහත පරිදි වේ.

## තීරණ අංක :- 01

ප්‍රධාන කාර්යාලයේ ඉඩම් විෂයභාර නිලධාරි, සංවර්ධන නිලධාරි කුමාරි මහත්මිය විසින් තෝරයාය ඉඟුරුවත්ත පොදු ඉඩමේ අනවසරයෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳ ලිපිය මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව මේ සඳහා සභාව විසින් කලයුතු නීතිමය පියවරයන් සියල්ලම ගෙන තිබුණද, බඩගමුව ටැම්පිට විහාරයේ විහාරාධිපති හිමියන් විසින් එම ගොඩනැගිල්ල ඉවත් කර ඉඩම නිදහස් නොකරන බැවින් මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමිය දැනුවත් කොට සන්තකය පවරා ගැනීමේ පනත අනුව අවශ්‍ය අධිකරණමය ක්‍රියාමාර්ග ලබා ගැනීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 02

ඉඩම් විෂයභාර නිලධාරි කුමාරි මිය විසින් දම්මඩවත්ත, බොරළුව වත්ත සභාව සතු පොදු ඉඩමේ අනවසරයෙන් තේක්ක ගස් කපා දැමීම පිළිබඳව සභාව මේ දක්වා කටයුතු කල ආකාරය සම්බන්ධ ලිපිය මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව වෙත යොමු කිරීමෙන් අනතුරුව මෙසේ අනවසරයෙන් ගස් කපා දැමීම සම්බන්ධව බෝගමුව පොලිස් ස්ථානයට පැමිණිලි කර එහි වත්මන් ප්‍රගතිය සතුටුදායක නොවන බැවින් මේ සම්බන්ධයෙන් වයඹ නියෝජ්‍ය පොලිස්පතිතුමා වෙත දැනුවත් කොට පොලීසිය මඟින් අවශ්‍ය නීතිමය පියවර ගැනීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි. තවද සභාව සතු පොදු ඉඩම් විධිමත් සමීක්ෂණයකින් අනතුරුව අයවැය මඟින් ප්‍රතිපාදන යොදවා සියළුම ඉඩම් ආරක්ෂා වන පරිදි ආරක්ෂිත වැටවල් සකස් කොට ‘‘සභාව සතු පොදු ඉඩමකි’’ බවට සඳහන් දැන්වීම් පුවරුවක් සවි කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 03

ඉඩම් විෂයභාර නිලධාරි විසින්, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් සභාව වෙත යොමු කරන ලද මල්ලවපිටිය ග්‍රිඩ් උපපොලේ සිට උඩවල්පොල හරහා වැහැර දක්වා වූ ද . වෝ. 33 කුළුණු රැහැන් මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ කමිටු වාර්තාව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ඉදිරිපත් කරන ලද වාර්තාවේ යෝජිත ප්‍රාදේශීය සභා මාර්ගයට ඇතුලත් වන ඉඩම්වල අයිතිය

ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම වෙනුවෙන් දැරීමට සිදුවන ඔප්පු ගාස්තු, මිනුම් ගාස්තු හා වන්දි ගෙවීම් සඳහා දැරීමට සිදුවන සියළුම වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරන බවට එකඟ වීම මත අදාල ඉඩම් හුවමාරුව පළාත් පාලන කොමසාරිස්තුමිය වෙත යොමු කොට එතුමියගේ උපදෙස් පරිදි සිදු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :– 04

පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් තල්විට ශ්‍රී සෝමානන්ද ග්‍රාමීය සංවර්ධන පදනම මඟින් ආදාහනාගාරයක් ලබා ගැනීමට කල ඉල්ලීම විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදුව මේ සම්බන්ධයෙන් කමිටු සාමාජිකයන් විසින් සාකච්ඡා කිරීමෙන් පසු ඉදිරියේදී ආදාහනාගාර දෙකක් පමණ සුදුසු තැන්වල ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අතර මේ සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමෙන් අනතුරුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කර ඒ අනුව ආදාහනාගාර ඉදිකිරීම සම්බන්ධයෙන් ක්‍රියාකරන බවත් මෙම ඉල්ලීම සම්බන්ධයෙන් එහිදී සලකා බලන බව දන්වා යැවීම සුදුසු බවටත් මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :– 05

කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින රජය සතු ඉඩම් පිළිබඳ සාකච්ඡාවට අදාලව කුරුණෑගල ප්‍රා. සභාවට පවරා ගැනීමට ඉල්ලීම් කර ඇති නමුත් මෙතෙක් පවරා නොදුන් ඉඩම් පිළිබඳ වාර්තාව විෂයභාර නිලධාරි විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදුව වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීමේ හැකියාව මත මෙම සියළුම ඉඩම් රජයේ මිනින්දෝරුවෙකු විසින් මැනීම් කටයුතු කර පවරා ගැනීම සිදු කර ගැනීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :– 06

බෝයගනේ සමෘද්ධි ප්‍රජාමූල බැංකුව මඟින් ගබඩා පහසුකම් සපයා ගැනීම සඳහා මල්පිටිය මාර්කට් ගොඩනැගිල්ලේ කාමර 03ක් වසර 03ක බදු පදනම මත ලබාගැනීමට කල ඉල්ලීම විෂයභාර නිලධාරියා විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලදුව මේ සම්බන්ධයෙන් කමිටු සාමාජිකයන් විසින් සාකච්ඡා කිරීමෙන් පසු මෙය ආදායම් උත්පාදනය කරගත හැකි ස්ථානයක් හෙයින් මෙහි නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ සැලසුමක් සෑදීමටත් එතෙක් කොන්දේසි සහිතව වාර්ෂික බදුකුලී පදනම මත වසර 03 ක් සඳහා මෙම කඩකාමර 03 නියමිත ටෙන්ඩර් ක්‍රියාවලිය මත ලබා දීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : – 07

ප්‍රධාන කාර්යාලයේ ආපන ශාලාව සම්බන්ධ ගැටළුව විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදුව මේ සම්බන්ධයෙන් බදුකරු විසින් හිඟ මුදල සම්පූර්ණයෙන් නොගෙවීම නිසා තැන්පතුවෙන් එම හිඟ මුදල අය කොට ගිවිසුම අවසන් කරන බව බදුකරුට ලිඛිතව දැනුම් දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : – 08

මල්පිටිය උප කාර්යාලයේ ඇති පරිගණක යන්ත්‍ර අක්‍රිය වීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපි කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පරිගණක අංශභාර නිලධාරියාගේ වාර්තාවට අනුව පවතින පරිගණක යන්ත්‍ර වල දෝෂ ඉවත් කර වැඩිදියුණු කිරීම් කටයුතු සිදු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : – 09

කුඩාගල්ගමුව මහලන්ද මාර්ග ගැටළුව විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදුව මෙම මාර්ගය දැනට අඩි 15 ලෙස ගැසට් කොට තිබෙන බැවින් අනුමත පිඹුර පදනම් කරගෙන ගැසට් පත්‍රය අඩි 20 ක් ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : – 10

සභාවේ මාර්ග සහ අනෙකුත් ස්ථාන සිතියම් ගත කිරීම සඳහා පෙර ගෙවුම් සබඳතාවය ලබා ගැනීම සම්බන්ධව 2025.06.18 දින පත් කල කමිටුව විසින් ගනු ලැබූ තීරණය විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදුව සභාවේ GIS ඒකකය මඟින් my track app එක මඟින් ඛණ්ඩාංක සිතියම් ගත කිරීමට වාර්ෂිකව google play store වෙත ගෙවිය යුතු රු. 899.00ක මුදල ගෙවීම කර එම මුදල අදාල විෂයභාර නිලධාරින් වෙත නැවත ප්‍රතිපූර්ණය කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : – 11

CAT 2020+ මෘදුකාංගයට අදාල වාර්ෂික සේවා ගිවිසුම සඳහා ගිවිසුම් ගත වීම හා ඒ සඳහා ගෙවීම් කිරීම සම්බන්ධව විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලිපියට අනුව CAT 2020+ මෘදුකාංගයට අදාලව වාර්ෂික සේවා ගිවිසුම සඳහා ගිවිසුම්ගත වීම සුදුසු බවටත්,මෙ සඳහා රු. 280,000.00 ක වාර්ෂික සේවා ගාස්තුවක් ගෙවීම සුදුසු බවටත් මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක : – 12

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කුරුණෑගල හා මල්ලවපිටිය ප්‍රාදේශීය කාර්යාල පවත්වාගෙන යාම සඳහා මල්පිටිය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගැනීම යටතේ එහි විදුලි පංකා සවිකිරීම සම්බන්ධව කාරක සභාවට ඉදිරිපත් කරන ලදුව මේ සම්බන්ධයෙන් තාක්ෂණ

නිලධාරි විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට ඉදිරිපත් කල වාර්තාවට අනුව විදුලි පංකා සවිකර දීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 13

අනතුරුදායක පොල් ගස ඉවත් කිරීමට අදාලව මුදල් ගෙවීමට නොහැකි බවට ඩබ්. එම්. මාලිනී මෙන්ඩිස් යන අය සිදුකරන ලද ඉල්ලීම විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදුව මේ සඳහා සභාව මඟින් දරන ලද වියදම අදාල පාර්ශවය විසින් වසරක් තුළ කොටස් වශයෙන් ගෙවීම කරන ලෙස දන්වා යැවීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 14

සභාව මඟින් ඉවත් කල ජීවිත හා දේපල වලට අනතුරුදායක ගස් හා ඒ සඳහා අය කරගත යුතු මුදල් පිළිබඳ විස්තරය විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදුව 2025 වර්ෂයට පෙර ඉවත් කල ගස් සඳහා පමණක් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවත්, 2025 වර්ෂයේ ඉවත් කරන ලද ගස් සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත් මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 15

මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ මල්කඩුවාව - කවුඩවත්ත මාර්ගය වැඩිදියුණු කිරීම සම්බන්ධව විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය පිළිබඳව සලකා බැලීමෙන් අනතුරුව මෙම මාර්ගය හා සම්බන්ධ වන ප්‍රාදේශීය සභාවට අයත් පිවිසුම් මාර්ග සඳහා බෝක්කු කැට යෙදීම සිදු කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 16

ග්‍රාමීය මාර්ග බොරළු දමා සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 2025 වර්ෂයට අදාල ගෙවීම් වාර්තා මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කරන ලදුව අනුයාත කර එවූ මුදලට අදාල ව්‍යාපෘති සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 17

ඕකිඩ් මාවතේ අනවසරයෙන් ඉදි කරන ලද තාප්පය සම්බන්ධ ගැටළුව විෂයභාර නිලධාරි විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලදුව මේ සම්බන්ධයෙන් කාරක සභාව විසින් සාකච්ඡා කල අතර,එහිදී මෙම අනවසර ඉදිකිරීම් සිදුකල පාර්ශ්වය වෙත අවස්ථා තුනකදී මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල අනුමැතිය ලබා ගන්නා ලෙස දැනුම් දීම කළද ,දැනුම් දුන් පරිදි කටයුතු නොකිරීම නිසා නීතිමය පියවර ගැනීම සඳහා සභාවේ නීති කටයුතු ඉටු කරනු ලබන ජී. බී. සේනානායක මහතා මඟින් ගරු අධිකරණයට

කරුණු වාර්තා කොට අධිකරණ ක්‍රියාමාර්ගයක් ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 18

සිරිකුලම්වත්ත මල්ලවපිටිය ජලය බැසයන කාණුව අවහිර වීම සම්බන්ධ ගැටළුවට අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ කමිටු නිර්දේශය විෂයභාර නිලධාරි විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලදුව ඒ. එම්. අක්‍රම් යන අය විසින් ජලය බැසයන කාණුව අවහිර වන සේ යොදා ඇති කොන්ක්‍රීට් කොටස කඩා ඉවත් කරන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ව.ප.පා.දෙ/03/09/01/03 අංක දරණ 2025.05.23 දිනැති ලිපියෙන් ලිඛිත උපදෙස් ලබා දී ඇති අතර මේ පිළිබඳව අදාල පාර්ශ්වය දැනුවත් කලද ක්‍රියාත්මක වී නොමැති හෙයින් මේ සම්බන්ධයෙන් සභාවේ වැඩ අධිකාරි මහත්මිය වෙත බලය පවරා සභාවේ කම්කරුවන් යොදවා බාධක ඉවත් කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 19

ජලනල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා මාර්ග පළුදු කිරීමේදී අය කරනු ලබන ගාස්තුව සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා නදීඋයන සුභසාධක සමිතියේ ලේකම් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධව විෂයභාර නිලධාරි විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව, මේ සම්බන්ධව ඇති ගාස්තු සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කර කමිටුවේ නිර්දේශ මත ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 20

බොරළු ප්‍රවාහනය සඳහා ගිවිසුම් කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් (උඩකොටුව, රත්කරව්ව බොරළු කපන ඉඩමේ සිට සියඹලන්ගමුව හංදිය දක්වා) වන ලිපිය විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදුව එම ඉල්ලීම් ලිපියේ ඇති අඩුපාඩු සියල්ල සම්පූර්ණ කොට නැවත ඉදිරිපත් කරන ලෙස දැන්වා යැවීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 21

ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ පහල හේවාපොල මිදිවෙල වත්ත පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධව විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිපිය පිළිබඳව සාකච්ජා කිරීමේදී , මෙහි දී අදාල රුඳවුම ගෙවීම් කටයුතු සිදු වී නොමැති බව තහවුරු කරගත යුතු බවත්, එම මුදල පොදු අරමුදලේ ඇති බවට තහවුරු කරගත යුතු බවත්, පරිපූරකයක් දමා ගෙවිය යුතු බවත් සාකච්ඡා කෙරුණු අතර මේ සියල්ල සලකා බලා පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් විමර්ෂනයක් සිදු කොට මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 22

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව විෂයභාර නිලධාරි විසින් මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදුව එම වාර්තාව මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා අදාල කාර්යමණ්ඩලය දැනුවත් කිරීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 23

2025 ජූනි මාසයට අදාල ආපදා ණය ගෙවීමට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා විෂයභාර නිලධාරි විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදුව, පහත නිලධාරීන් සඳහා ආපදා ණය ගෙවීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

| | |
|---|---|
| 01. වයි.සී.එස්.සමරසිංහ මිය | රු.250000.00 |
| 02. එස්.ඉලංග සේනාරත්න මයා | රු.250000.00 |
| 03. ඒ.එම්.ජී.ජේ.රණසිංහ මිය | රු.250000.00 |
| 04. කේ.බී.ආර්.එම්.කුමාර මයා | රු.250000.00 |
| 05. ජේ.එම්.ආර්.ජයසුන්දර මයා | රු.400000.00 |
| 06. එම්.එම්.ආර්.ජී.හේරත් මිය | රු.400000.00 |
| 07. ඩී.එම්.අතුකෝරාල මයා | රු.400000.00 |
| 08. බී.ආර්.සී.ඒ.බස්නායක මයා | රු.400000.00 |
| 09. එම්.ඩී.ජී.පී.චන්ද්‍රපාල මයා | රු.400000.00 |
| 10. ඩබ්.එම්.එස්.අනුරංග මයා | රු.400000.00 |
| 11. ඩී.එම්.එස්.ජේ.දිසානායක මිය | රු.400000.00 |
| 12. බී.එම්.එන්.එල්.බස්නායක මයා | රු.400000.00 |
| 13. එස්.කේ.ආර්.කේ.ජයසූරිය මයා | රු.400000.00 |

## තීරණ අංක :- 24

2025 වර්ෂය සඳහා වත්කම් බදු දීමේ හයවන වර ප්‍රසම්පාදන මණ්ඩල වාර්තාව විෂයභාර නිලධාරි විසින් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදුව එම වාර්තාව පිළිගැනීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලද අතර එහිදී අදාල පාර්ශ්වයන් වෙත බදු ලබා දීමේදී " වගා කටයුතු සඳහා පමණි" වශයෙන් දැන්වීම් පුවරුවක් යෙදිය යුතු බව කොන්දේසියක් ලෙස බදු ගිවිසුමේ ඇතුලත් කල යුතු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 25

බෝගමුව 05 කනුව සිට කුරුණෑගල කටුපිටිය රඹුක්කන ප්‍රධාන මාර්ගය දක්වා වන ප්‍රාදේශීය සභා මාර්ගයේ බොරළු ප්‍රවාහනය අවසර ලබාදෙන ලෙස ඉල්ලා ඩී.එම්.සී දිසානායක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සුදුසුකම් සපුරා ඇති බැවින් ගිවිසුම්ගත වීම සඳහා අනුමැතිය ඉල්ලා විෂයභාර නිලධාරි විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද ලිපියට අනුව එම ගිවිසුම්ගත වීමට අනුමැතිය ලබා දීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 26

පාළුගම දාහිගමුවේ පිහිටා ඇති වාසනා වැඩිහිටි නිවාසයේ පාලිකාව විසින් තම වැඩිහිටි නිවාසයේ සිටින වැඩිහිටියන් මිය යාමෙන් පසුව කුරුණෑගල ප්‍රාදේශීය සභාව යටතේ පවත්වාගෙන යනු ලබන ආදාහනාගාරය මගින් නොමිලේ ආදාහනය කර දෙන ලෙසට ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව විෂයභාර නිලධාරී විසින් මේ සඳහා ලබාදී ඇති වාර්තාව තුලින් කුරුණෑගල ප්‍රාදේශීය සභාව යටතේ පවත්වාගෙන යනු ලබන ආදාහනාගාර මඟින් නොමිලේ සිදුකරන ආදාහනවලට අදාල ගැසට්පත්‍රය කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදි. එම ගැසට් පත්‍රයට අනුව බල ප්‍රදේශයේ වැඩිහිටි නිවාසවල සිටින වැඩිහිටියන්ගේ මෘත ශරීර ආදාහනය සඳහා මුදල් අය නොකරන බව දැක්වුවද, මේ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදුකර, ග්‍රාම නිලධාරී වාර්තාවක් මඟින් තහවුරු කරගැනීමකින් පසු මුදල් අයකර පවත්වා ගෙන යනු ලබන වැඩිහිටි නිවාස සඳහා ගැසට් පත්‍රයේ සඳහන් වන නොමිලේ ආදාහන කටයුතු සිදු කරන සහනය ලබා නොදීම සුදුසු බවට මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

## තීරණ අංක :- 27

සභාවේ ව්‍යවස්ථාපිත කාරක සභා 04 හි බලතල පැවරීම් විෂයභාර නිලධාරින් විසින් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදුව ඒ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් පසු මෙම බලතල පැවරීම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාව විසින් තීරණය කරන ලදි.

### <u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවට පැවරී ඇති බලතල</u>

1. සභාව විසින් සපයනු ලබන සේවාවන්ට අදාළව සියළු අංශ මගින් සකස් කරනු ලබන ආංශික සැලසුම්, වාර්ෂික සංවර්ධන සැලසුම් සහ සිව් අවුරුදු සැලසුම් නිර්දේශ කර මහ සභාවට ඉදිරිපත් කිරීම

2. අඩු ආදායම්ලාභී පවුල් වල ආර්ථික, සාමාජීය හා සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම හා සියලු ප්‍රජා සුභ සාධන වැඩසටහන් ආධාර ලබා දීම් සඳහා සභා අරමුදල් වියදම් දැරීම සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම

3. සභා බල ප්‍රදේශයේ ප්‍රජා සංවර්ධන සංවිධාන ඇති කිරීම, පවත්වාගෙන යාම, ඒ සංවිධාන ශක්තිමත් කිරීම සහ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කාර්යන්ට ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමෝපාය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

4. සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම හා ඒ පිළිබඳව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

5. සභා බල ප්‍රදේශය තුළ පොදු උත්සව, සංස්කෘතික ක්‍රියාකාරකම්, ආගමික උත්සව හා ප්‍රජා පිළිගැනීම් සංවිධානය කිරීම, දහම් පාසල් වල කාර්ය ප්‍රවර්ධනය සහ පොදු විනෝද කටයුතු සංවිධාන කිරීම පළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

6. සභා බල ප්‍රදේශය තුළ පොදු වෙළඳපොළ සහ සතිපොළ පැවැත්වීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

7. සභා බල ප්‍රදේශය තුළ ක්‍රීඩා භූමි සහ ක්‍රීඩාගාර ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

8. සභා බල ප්‍රදේශය තුළ ප්‍රජා ශාලා සහ උත්සව ශාල ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

9. ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන මහජන පුස්තකාල හා පෙර පාසල් හා ආයුර්වේද පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

10. මහජන පුස්තකාල ආශ්‍රිතව පාඨක සමාජ ඇති කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒවායේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සහය ලබා දීමට නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

11. බල ප්‍රදේශයේ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් සකස් කිරීම හා නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

12. බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ජංගම වැඩසටහන් පැවැත්වීම ආදිය සම්බන්ධ නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

13. බල ප්‍රදේශයේ ජල හා සනීපාරක්ෂක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වියදම් දැරීම හා නිරීක්ෂණ, නිර්දේශ මහා සභාවට ලබා දීම.

14. මාතෘ හා ළමා සෞඛ්‍ය නැංවීම සඳහා වැඩසටහන් සකස් කිරීම, වියදම් දැරීම හා බටහිර වෛද්‍ය සෞඛ්‍ය සායන සහ ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

15. බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන සමඟ සමීපව සම්බන්ධ වෙමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පහසුව හා සුභ සාධනය සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

16. සභා බල ප්‍රදේශය තුළ ඇති විය හැකි ගිනි ගැනීම් වැළැක්වීම හා ගිණි නිවාරණය පිළිබඳ ආසන්න පළාත් පාලන ආයතන සමඟ එකඟතා ඇති කර ගැනීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

17. සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන දිළිඳු තැනැත්තන්ට උපකාර කිරීම සහ සභා ජනතාවගේ ආපදා අවස්ථා කළමනාකරණය පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

18. බල ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය නිවාරණ, මනෝ විද්‍යාත්මක උපදේශන වැඩසටහන් හා පොදු සුභ සාධන වැඩසටහන් සඳහා නිර්දේශ ලබාදීම.

<u>**පරිසර සහ පහසුකම් පිළිබඳ කාරක සභාව**</u>

1. මදුරුවන් හෝ වෙනත් කෘමි සතුන් බෝවීම, ඒ මඟින් රෝග බෝවීම පාලනය පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම

2. මහජන පීඩා වැළැක්වීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

3. නිවාස වල ඇති කරන සහ අඩාවතේ යන සුනඛයන් වන්නත් කිරීම, සුනඛ ගහණය පාලනය කිරීම හා ජලභීතිකා රෝගය පාලනය කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

4. ආසාදන රෝග හා වසංගත රෝග මර්දනය කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

5. වැසිකිළි හා වසුරු වළවල් විධිමත් කිරීම , පාලන හා ගලි බවුසර් සේවා පවත්වාගෙන යාම පිළබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම

6. ප්‍රාදේශිය සභා සම්මත අතුරු ව්‍යවස්ථා වල සහ සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථා වල සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට අදාළ අතුරු ව්‍යවස්ථා වලින් සභාවට බලය ලැබී ඇති කාර්ය පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම

7. සුසාන භූමි හා ආදාහනාගාර විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම

8. සභා බල ප්‍රදේශය තුළ රැස් කරනු ලබන කසළ රැස් කිරීම , ප්‍රවාහනය, පිරියම් කරීම අවසන් බැහැර කිරීම සහ කාණු පිරිසිදු කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම

9. අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම, නැවත භාවිතය, ප්‍රතිචක්‍රීකරණය, ද්‍රව්‍ය මිලට (7R System) සහ අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

<u>මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව - බලතල පැවරීම</u>

1. ප්‍රාදේශීය සභා පනතේ II වන, III වන, IV වන, V වන සහ VI වන කොටස් සම්බන්ධයෙන් මහ සභාව විසින් අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම.
2. වරිපනම්, සියළුම බදු හා ගාස්තු නියම කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
3. අළුත් ආදායම් වර්ග හඳුනා ගැනීම හා ආදායම් පැනවීම පිළිබඳ ව මහ සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
4. ආදායම් රැස් කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
5. අය කර ගත නොහැකි ආදායම් කපා හැරීම පිළිබඳ ව අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා වන නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
6. විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ විනෝද බදු පැනවීමටඅවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
7. ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල සහ ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන අතුරු ව්‍යවස්ථාවල මුදල් පිළිබඳ කාර්ය හා සම්බන්ධව අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
8. ප්‍රාදේශීය සභාව සතු දේපල බදු දීම, කුලියට දීම, බැහැර කිරීම හෝ වෙනත් ආකාරයක ගනුදෙනු පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
9. ප්‍රාදේශීය සභාවට දේපල අත්පත් කර ගැනීම හා මිලදී ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
10. ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන වෙනත් මුදල් ගනුදෙනු කාර්ය පිළිබඳ තීරණ සඳහා අදාල නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
11. සෙසු කාරක සභා විසින් මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාවට කෙරෙන නිරීක්ෂණ සලකා බලමින් ඒ පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
12. ප්‍රාග්ධන භාණ්ඩ හා තොග භාණ්ඩ හෝ ද්‍රව්‍ය මිලදී ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම හා අවම තොග මට්ටම් පවත්වා ගැනීම සිදු කිරීමේදී අනුගමනය කල යුතු ක්‍රමවේදය පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මහසභාවට ඉදිරිපත් කිරීම.
13. වාර්ෂික භාණ්ඩ හා තොග සමීක්ෂණ කාර්ය සිදු කිරීම පිළිබඳ ප්‍රගතිය මැන බැලීම සහ එහිදී අනුගමනය කල යුතු ක්‍රමවේදය පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
14. එක් එක් වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනා ගනු ලබන අබලි භාණ්ඩ අලුත්වැඩියා කිරීම, විකිණීම හෝ විනාශ කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
15. ප්‍රාග්ධන භණ්ඩ හෝ තොග ඌනතා පිළිබඳ විමර්ෂනය කිරීම සහ ඒ පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
16. ප්‍රාග්ධන භාණ්ඩ හෝ තොග භාණ්ඩවලට සිදු වන හානි හෝ පාඩු පිළිබඳව විමර්ෂනය කිරීම හා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

17. ගබඩා කළමනාකරණයේදී අනුගමනය කල යුතු ක්‍රමෝපාය අධ්‍යයනය කිරීම හා ඒ පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
18. ප්‍රාදේශීය සභාව සතු වත්කම්වල නාස්තිය හා දූෂණය අවම කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
19. ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇති කාර්ය හෝ කර්තව්‍යය ක්‍රියාවට නැංවීමේදී සිදු විය හැකි වියදම් අවම කිරීමට අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
20. ප්‍රාදේශීය සභාවේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සහ කෙටුම්පත් සංයුක්ත සැලැස්ම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
21. ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තනතුරු හා ධූර ඇති කිරීම පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකි වනු පිණිස අධ්‍යනය කර මහ සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
22. ප්‍රාදේශීය සභාවට අවශ්‍ය බවට ගරු ආණ්ඩුකාරතුමා වෙත නිර්දේශ කෙරෙන තනතුරු හා ධූර පිළිබඳ ව වැටුප්, දීමනා හෝ පාරිශ්‍රමික නියම කිරීමට හැකි වනු පිණිස අධ්‍යයනය කර මහ සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
23. ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ගමන් වියදම් හෝ පරිවර්තිත ගමන් වියදම් සීමා නියම කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
24. ප්‍රාදේශීය සභාවේ කාර්යයන්ට අදාළව මහ සභාව විසින් පවත්වා ගත යුතු දත්ත හා සංඛ්‍යා ලේඛන කවරේද යන්න තීරණය කිරීම.
25. ප්‍රාදේශීය සභාවේ ලිපිලේඛනවල ආරක්ෂාව සහ ලේඛනාගාර පිළිබඳව මහ සභාවට නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
26. ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයට කාර්ය පැවරීම හා ඒවා සමාලෝචනය පිණිස අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
27. ප්‍රාදේශීය සභාවට අදාල නීති කෘත්‍ය පිළිබඳව ගනු ලැබිය යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
28. ප්‍රාදේශීය සභාව විසින් පනවා ගත යුතු අතුරු ව්‍යවස්ථා පිළිබඳව කරුණු රැස් කිරීම හා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහසභාවට ඉදිරිපත් කිරීම.
29. ප්‍රාදේශීය සභාව විසින් ඉටුකල යුතු සංවර්ධන ක්‍රියාකාරකම් ඇතුලත් යෝජනා ඇතුලත් සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම සහ කෙටුම්පත් සංයුක්ත සැලැස්ම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
30. සභාව විසින් අනුමත කල යුතු සංයුක්ත සැලැස්මට අනුව එක් එක් වර්ෂයේ මූල්‍ය සැලැස්මට සමගාමීව සංවර්ධන යෝජනා ප්‍රමුඛතාගත කිරීම, වාර්ෂික සංවර්ධන සැලැස්ම කෙටුම්පත් කිරීම සහ ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
31. සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම්වල/ කර්මාන්තවල ප්‍රගතිය වරින් වර විමංසනය කිරීම, ඒ සඳහා කල යුතු අත්‍යවශ්‍ය වෙනස්කම් හෝ සංශෝධන සහ අනුගමනය කල යුතු වෙනත් ක්‍රියාමාර්ග පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

32. අවශ්‍ය අවස්ථාවකදී වාර්ෂික සංවර්ධන සැලැස්මට කල යුතු වෙනස්කම් හෝ සංශෝධන පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
33. සභා අරමුදලින් කරනු ලබන රු. 2000 000.00 දක්වා කරනු ලබන සියළු වියදම් අනුමත කිරීම.
34. සෙසු වියදම් නිර්දේශ කොට මහ සභාවට ඉදිරිපත් කිරීම.

<u>කාර්මික සේවා කාරක සභාවේ බලතල පැවරීම</u>

1. සභාව සතු ඉඩම් පරිපාලනය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
2. වීථි හා මාර්ග සම්බන්ධව ප්‍රාදේශීය සභාව සතු බලතල,කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කල යුතු ක්‍රමවේදය පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
3. විථි මාර්ග නම් කිරීම,ස්මාරක ඉදි කිරීම හා ප්‍රසිද්ධ උද්‍යාන ආදිය නම් කිරීම පිළිබඳව පිළිවලින් ප්‍රාදේශීය සභා පනතේ 32 (ඈ)වන සහ 198 වන වගන්තිය යටතේ මහසභාව විසින් ගනු ලැබිය යුතු තීරණ පිළිබඳ නිරීක්ෂණ හ නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
4. විථි අවහිර කිරීම,විථි ආදියට හානි පැමිණවීම,අයුතු ඇඳෑගැනීම්,විථි වල කටයුතු වලට බාධා වන ගස් හා අනතුරුදායක ගස් හො අතු හෝ කඳන් හෝ ගෙඩි ඉවත් කිරීම පාලනය පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
5. සභා බල ප්‍රදේශය තුල නව විථි මාර්ග ඇති කිරීම හෝ මාර්ග පුලුල් කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
6. සභා බල ප්‍රදේශය තුල වීථි රේඛා නියම කිරීම,වෙනස් කිරීම,සංශෝධනය කිරීම හො අහෝසි කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
7. විථි වල කෙරෙන කරදර ආදිය පාලනය කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
8. විශේෂ කාර්ය සඳහා විථි ප්‍රයෝජනයට ගැනීම සහ සභා බල ප්‍රදේශයේ විථි වල පවතින බාධක හා ප්‍රසර්පණ ඉවත් කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
9. සභා බල ප්‍රදේශය තුල පවත්නා අනවසර ඉදි කිරීම් පාලනය,නිත්‍යානුකූල කිරීම හෝ ඉවත් කිරීම සහ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත මඟින් ප්‍රාදේශීය සභාවට පැවරෙන කාර්ය ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
10. විථි හා පොදු ගොඩනැගිලි ආලෝකකරණය පිළිබඳව නිරීක්ෂණ හා නිගමන නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
11. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සියළුම විථි මාර්ග,මංමාවත්,පටුමං වල රථවාහන ගමනාගමනය නියාමනය කිරීම හා පාලනය කිරීම පිළිබඳව මහ සභාවේ තිරණ ගැනීමට අවශ්‍ය කරුණු අධ්‍යනය කර නිර්දේශ වාර්තා ඉදිරිපත් කිරීම
12. ඉඩම් කට්ටි කිරීම හා ගොඩනැගිලි ඉදි කිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ සැලසුම් හඳුනාගෙන උචිත බලධාරියා වෙත නිර්දේශ කිරීමට මහ සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

13. සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉදි කිරීම් වල/කර්මාන්ත වල කාර්ය සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම
14. ප්‍රාදේශීය සභාව සතු මාර්ග හා ඉඩම් පිළිබඳව දත්ත පද්ධතිය කලින් කල සමාලෝචනය කිරීම හා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.
15. සභා සතු මාර්ග හා ගොඩනැගිලි සහ ඉදි කිරීම් නඩත්තුව හා අළුත්වැඩියා කිරීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

.........................

සකස් කළේ,

සංවර්ධන නිලධාරී,

(එස්.පී.ඩී.ආර්.සමරවීර)

..............................

සභාපති,

කුරුණෑගල ප්‍රාදේශීය සභාව.